# අය වැය හා ජනතා විමුක්ති පෙරමුණේ උපාය මාර්ග



(සීවලි එදිරිවීර)

මෙම ලිපිය කියවන්නට අවස්ථාව ලැබෙන විට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ තුන්වන අයවැය ලේඛණ පාර්ලිමේන්තුවේදී සම්මත වී තිබිය හැකිය. නොඑසේ නම් එය වැඩි ඡන්දයෙන් පරාජයට පත්වී මහ මැතිවරණයක් පැවැත්විය යුතු තත්ත්වයක් වුවද උදාවී තිබිය හැකිය.

කොහොම නමුත් අයවැය ලේඛණයක් ඉදිරිපත් කළ සෑම අවස්ථාවකම විපක්ෂය එය පරාජය කොට පාලන බලය ඔවුන් අතට ගැනීමට උත්සාහ කිරීමත් රජය කෙසේ හෝ ඉන් ජයග්‍රහණය කොට තවදුරටත් පාලන බලය තමන් වෙත රඳවා ගැනීමටත් උත්සාහ කිරීම සිරිතය.

මේ සඳහා ආණ්ඩු පක්ෂය මෙන්ම විපක්ෂයද විවිධ උපක්‍රම හා මෙහෙයුම් ක්‍රියාවට නංවන බැවින් මෙවර ජනාධිපතිවරයා ඉදිරිපත් කළ අයවැය ලේඛණය පිළිබඳ ලැබුණු ප්‍රතිඵලයද සහිතව එය සම්මත කර ගැනීමට හා පරාජය කිරීමට දෙපාර්ශවය කටයුතු කර තිබූ ආකාරයත් පිළිබඳ කරණ විග්‍රහයකට ඔබේ අවධානය යොමු කිරීම මේ ලිපියේ අරමුණය.

සාමාන්‍යයෙන් අයවැය ලේඛණයක් ඉදිරිපත් කරනු ලබන්නේ මේ රටේ සංවර්ධනය සඳහා ක්‍රියාවට නැංවීමට යෝජනා කරණ සැලසුම් හා ඒවාට වැය කිරීමට අවශ්‍ය මුදල් උපයා ගැනීමට කරනු ලබන යෝජනා සම්මත කර ගැනීමටය.
එහෙත් ශ්‍රී ලාංකිකයින් බොහෝ කලක සිටම අයවැය ලේඛණයක් තුළින් වෙළෙඳපොල භාණ්ඩ හා සේවා මිල ගණන් පහත දැමීමක් හා සහනාධාර සැපයීමක් බලාපොරොත්තුවීම පුරුද්දක් කර ගෙන ඇත.

කොහොම නමුත් ජනාධිපතිවරයාට මෙවර අයවැය ලේඛණය ඉදිරිපත් කරන්නට සිදුවී තිබුණේ තිරිඟු පිටි සහල් හා කිරිපිටි වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ සියල්ලකම පාහේ මිල ගණන් අධික වේගයෙන් ඉහළ ගොස් ඇති වකවානුවකය.

ආණ්ඩු පෙරළන්නට මුහුණුවර වෙනස් කරන්නට අයවැය ලේඛණයකට හැකියාව ඇති නිසා මෙපමණ කළක් ආණ්ඩු පක්ෂයට වී නිහඬව සිටි කළ කිරුණු මැති ඇමැතිවරුන් විපක්ෂයේ අසුන් ගන්නා අයුරුත් තනතුරු, ලාභ අපේක්ෂාවෙන් හෝ නොඑසේනම් රටට සේවය කිරීමේ උවමනාවෙන් හෝ විපක්ෂයේ සිට ආණ්ඩුවට එක්වන පිරිස්ද අයවැය ලේඛණය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට එය සම්මත කර ගැනීම දක්වා ඇති කාල පරාසය තුළ ඕනෑ තරම් සිටිය හැකිය.

මේ පිරිස පාර්ලිමේන්තුවට යැවූ ජනතාවට එකී කාලය තුළ කළ හැක්කේ එහාට මෙහාට පනින මැති ඇමැතිවරුන් ගණන් කරමින් සිටීමටය.
කොහොම නමුත් ජනාධිපතිවරයා මෙවර ඉදිරිපත් කළ අයවැය ලේඛණයට ආර්ථික අපහසුතා මැද ජීවත් වන සාමාන්‍ය ජනතාව බලාපොරොත්තු වූ සහනාධාර නොවීම රජයට අත්කර දී ඇත්තේ අවාසිදායක තත්ත්වයකි.

එබැවින් මතුපිටින් පෙනෙන ආකාරයට නම් විපක්ෂයේ කිසිම පක්ෂයකින් අයවැය ලේඛණයට සහය නොලැබෙන බවක් දක්නට විය.

තමන්ට වෙන්කර ඇති ප්‍රතිපාදන පිළිබඳ කළකිරී සිටින ආණ්ඩු පක්ෂයේ මැති ඇමැතිවරුන්ද අවසාන මොහොතේ අයවැය ලේඛණයට විරෝධය පෑමට බැරි කමක් නැත.

එක්සත් ජාතික පක්ෂය මෙන්ම දෙමළ ජාතික සංවිධානයද මේ වනවිටත් අයවැය ලේඛණයට විරුද්ධව ඡන්දය දීමට තීරණය කර තිබූ අතර ඔවුන් විපක්ෂයේ අනෙකුත් පක්ෂ වලින්ද එලෙස කරණ ලෙස ඉල්ලා තිබුණි.

මේ අතර විපක්ෂයේ තවත් ප්‍රධාන පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුණද අයවැය ලේඛණයට විරෝධය පෑ නමුත් ඔවුන් ඒ පිළිබඳව ගන්නා අවසන් තීරණය ඡන්ද විමසන අවසන් මොහොත දක්වාම හෙළි නොකිරීමටද තීරණ කරනු ලැබීය.

ජනාධිපතිවරයා ඉදිරිපත් කළ අයවැය ලේඛණය ජනතා ද්‍රෝහී එකක් සේ ප්‍රකාශ කර ඇති ඔවුන් එය නිර්ලෝභීව විවේචනය කළේය. එමගින් ජනතා විමුක්ති පෙරමුණ තමන් සමඟ සිටින්නේය යන හැඟීම ජනතාවට ලබා දෙන්නට සමත් වී ඇත.

එහෙත් දෙවනුව විපක්ෂයේ ප්‍රධාන පක්ෂ්‍ය වන එක්සත් ජාතික පක්ෂය දේශ ද්‍රෝහී පක්ෂයක් ලෙස හඳුන්වා දීමටද ඔවුන් පෙළඹී තිබුණි. එම හැඳින්වීම තුළින් ඔවුන් නොකියා කියා ඇත්තේ ජනතා ද්‍රෝහීන් පන්නා කිසිසේත්ම තමන් දේශ ද්‍රෝහීන්ට රට භාරදීමට සූදානම් නැතැයි යන්න විය හැකිය.

එසේ නම් අයවැය ලේඛණයට විරෝධය පාන ජනතා විමුක්ති පෙරමුණ ඊට විරුද්ධව ඡන්දය පාවිච්චි කරාවිදැයි යන්න සැක සහිතය.

අයවැය ලේඛණය පරාජයට පත්වුවහොත් නැවතත් පාර්ලිමේන්තු මැතිවරණයකට යා යුතුය. එවැනි තත්ත්වයකට මුහුණදීමට ජනතා විමුක්ති පෙරමුණ කැමැත්තක් නැති බව නම් ඉතාම පැහැදිලිය.

තවදුරටත් තමන් ජනතාව සමඟ සිටින වගත් මැතිවරණයකට යෑම වළක්වා ගැනීමත් ජනතා විමුක්ති පෙරමුණට ඉතා අවශ්‍යය. ආණ්ඩුව ජනතා ද්‍රෝහීන් ලෙසත්, එක්සත් ජාතික පක්ෂය දේශ ද්‍රෝහීන් ලෙසත් හඳුන්වන්නේ ඔවුන්ගේ අනාගත යහපත සඳහා බවට විශ්වාස කළ හැක්කේ එබැවිනි.

යම් දිනක අයවැය ලේඛණය පරාජය කරන්නට උපකාර නොකළේ මන්දැයි ප්‍රශ්න කරණ ඕනෑම කෙනෙකුට දිය හැකි කදිම පිළිතුරක් ඔවුන් ඉහත ප්‍රකාශ ඔස්සේ සූදානම් කරගෙන ඇත.

හිටපු ඇමැතිවරයෙකු වූ එස්.බී. දිසානායක මහතා ජනතා විමුක්ති පෙරමුණ අයවැය ලේඛණය පිළිබඳව අනුගමණය කරන ක්‍රියාමාර්ගය කල් ඇතිව ප්‍රකාශ කර තිබුණේ ජනතා විමුක්ති පෙරමුණේ නියෝජිතයෙකු පරිද්දෙනි.

එතුමා ප්‍රකාශ කරණ පරිදි අයවැය ලේඛණය පරාජය වුවහොත් එළඹෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණට ආසන 10 ක් පවා දිනා ගැනීම අපහසුය. එලෙස පක්ෂයේ තත්ත්වය ප්‍රදර්ශණය වනවාට ඔවුන් අකමැතිය. එහෙත් ජනතාවට දැනෙන පරිදි අයවැය ලේඛණයට විරුද්ධත්වයද ප්‍රකාශ කළ යුතුය. එබැවින් තම පක්ෂය අයවැයට විරුද්ධව ඡන්දය දුන්නද එය පරාජය නොවන බව පෙනෙන්න නම් ස්ථිරවම ඔවුන් විපක්ෂය සමඟ එක්වී අයවැයට විරුද්ධව ඡන්දය දෙනු ඇත. නමුත් තම පක්ෂයේ ඡන්ද නිසා පරාජය වෙන බවක් වැටහී ගියහොත් ඔවුන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටිනු ඇත. ඒ එස්.බී. දිසා-නායක මහතාගේ විග්‍රහයේ සංක්ෂිප්ත අදහසය.

කෙසේ වුවත් ජනතා විමුක්ති පෙරමුණ ඡන්දය දීමෙන් වැලකී සිටියදී වුව අයවැය ලේඛණය පරාජය කිරීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක විය හැකිය. එසේ සිදුකළ හැක්කේ අවසන් මොහොතේ ආණ්ඩු පක්ෂයේ මැති ඇමැතිවරු පිරිසක් විපක්ෂයට එක් කර ගැනීම තුළිනි.

මේ නිසා දිසානායක මහතාගේ විග්‍රහයේ කරුණක් පිළිබඳවද සිතා බැලීමට සිදුව ඇත. මැති ඇමැතිවරු-න් විපක්ෂයට ගොස් අයවැය පරාජය කිරීමට ඇති ඉඩකඩ අවම කිරීමේ හැකියාවද ජනතා විමුක්ති පෙරමුණ සතුය.

මැති ඇමැතිවරුන් විපක්ෂයට යෑමෙන් අයවැය ලේඛණය පරාජයවීමේ අවදානමක් තිබෙනු දුටුවහොත් අයවැය ලේඛණයට පක්ෂව හෝ ඡන්දය දී රජය රැක ගැනීමට ඔවුන් වැඩි කැමැත්තක් දක්වන බව ජනතා ද්‍රෝහී හා දේශ ද්‍රෝහී උපමාවෙන් පැහැදිලි වෙයි.

පසුගියදා ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ අමරසිංහ මහතා අයවැයට පක්ෂව ඡන්දයදීම සඳහා රජයට වහාම ඉටුකළ යුතු කරුණු 4 ක් ඉදිරිපත් කළේය. රටේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමට පියවර ගැනීම, සර්ව පාක්ෂික කමිටුව විසුරුවා හැරීම, සටන් විරාම ගිවිසුම අහෝසි කිරීම හා මානව හිමිකම් ප්‍රශ්ණයට එක්සත් ජාතීන්ගේ සංවිධානයට අතපෙවීමට ඉඩ නොදී එහි අයිතිය රජය වෙත තබා ගැනීම එම යෝජනාවන්ය.

මෙම යෝජනා බහුතරයකගේ හිත් දිනාගත් ඒවාය. ඒවාට එකඟ වන රජයකට සහායවීම වරදක් ලෙස ජනතාව නොදකින බව ජනතා විමුක්ති පෙරමුණ හොඳාකාරවම දන්නේය.

වර්තමාන රජයද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර නැතත් දැනටමත් ක්‍රියාවට නංවමින් සිටින්නේද ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාවන්මය. ඒ නිසා රජය ආරක්ෂා කර ගැනීමට අත්‍යාවශ්‍ය නම් එම යෝජනා ප්‍රසිද්ධියේ පිළිගැනීමට රජයද පසුබට වේ යයි සිතිය නොහැකිය.

මේ නිසා ජනතා විමුක්ති පෙරමුණට මෙන්ම රජයටද තම තමන්ගේ ගෞරවය රැක ගනිමින්ම තම තමන්ගේ තනතුරුද බේරා ගැනීමට සෝමවංශ අමරසිංහගේ යෝජනා ගෙන එන්නේ විශාල උපකාරයකි.

මේ අනුව බලන විට ආණ්ඩුවට එක්ව සිටින අනෙකුත් පක්ෂ හා සංසන්දනය කරණ විට ජනතා විමුක්ති පෙරමුණ විපක්ෂයේ සිටිමින් ආණ්ඩුව රැක ගැනීමට ලබා දෙන්නේ පුදුමාකාර සහයෝගයකි. එහි වටිනාකම ඉහළ යන්නේ තමන් සමඟ සිටින ජනතාවට නොතේරෙන ලෙස සිය අභිප්‍රායන් මුදුන් පමුණුවා ගන්නට ඔවුන් තුළ ඇති හැකියාවන් නිසාය. දේශපාලනයට ඒවා නැතුවම බැරි ගුණාංගයන් බව කිව යුතුය.

ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය පරීක්ෂා කර බලන විට මැතිවරණයකින් තම තමන් ලබා ගන්නා ඡන්ද ප්‍රමාණයන් වැඩි කරගෙන ඇත්තේ විපක්ෂයේ සිටි පක්ෂයන්ය. ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩු පක්ෂයේ පක්ෂයක් ලෙස පෙනී නොසිටින්නේ එය අවබෝධ කර ගෙන ඇති බැවිනි.

■

---

27 වන පිටෙන්

නොහැකි වී තිබුණත් ඒ අභියෝගය භාරගෙන මියන්ඩාඩ් අසලටම පැමිණෙන්නට එකම එක ක්‍රීඩකයෙකු පමණක් සමත් වී තිබුණි.

''එහෙත් ඉක්මන් කොටයි'' යන්න නැවත වරක් අර්ථවත් ප්‍රකාශයක් බව සනාථ කළ ඔහුද මියන්ඩාඩ්ගේ වාර්තාව ආසන්නයටම පැමිණ ඔහු අභියස දණින් වැටුණේ අනවශ්‍ය ඉක්මන්වීමේ ප්‍රතිඵලය නිසාය.

මේ අවාසනාවන්තයා හැඳින්වෙන්නේ ඉන්සමාම් උල් හක් යන නමිනි. ඔවුන් දෙදෙනා සංසන්දනය කිරීමේදී සමහර කරුණු අනුව නම් ඉන්සමාම් උල් හක් වඩා ඉදිරියෙන් සිටින බව කිව හැකිය. ඊට උදාහරණ සපයන්නේ නම් මියන්ඩාඩ් සහභාගි වී ඇති ටෙස්ට් තරග සංඛ්‍යාව 124 ක් වෙද්දී ඉන්සමාම් උල් හක් සහභාගි වී ඇතතේ තරග 120 කටය.

එහිදී මියන්ඩාඩ් ලකුණු 8832 ක් ලබා ගන්නා විට උල් හක් 8830 ක් රැස්කර ඇත. මියන්ඩාඩ්ගේ හොඳම ටෙස්ට් ඉනිම නොදැවී ලබාගත් ලකුණු 280 කි. ඉන්සමාම් එය ලකුණු 329 ක් ලෙස සටහන් කර ඇත. මියන්ඩාඩ් ටෙස්ට් ශතක 23 ක් හා අර්ධ ශතක 43 ක් වාර්තා කරද්දී උල්හක් ශතක 25 ක් හා අර්ධ ශතක 48 ක් වාර්තා කර තිබුණි.

මේ සියලු දත්තයන් විමර්ශණය කර බලද්දී ඉන්සමාම් උල් හක්ට පාකිස්ථානයෙන් බිහි වූ වැඩිම ටෙස්ට් ලකුණු ලාභියා යන ගෞරවය අහිමි වී ඇත්තේ ලකුණු 3 කිනි. මේ නිසා උල් හක්ට සදාකාලිකවම මියන්ඩාඩ්ට දෙවැනි වී ඉතිහාසය තුළ රැඳෙන්නට සිදුවී අවසන්ය.

දකුණු අප්‍රිකාව සමඟ පසුගිය ඔක්තෝබර් 8 වැනිදා සිට 12 වැනිදා දක්වා ලාහෝර් හී පැවති ටෙස්ට් ක්‍රිකට් තරගයෙන් පසු තමන් අන්තර් ජාතික ක්‍රිකට් පිටියෙන් සමුගන්නා බව කල්තියා ප්‍රකාශ කොට තිබූ ඉන්සමාම් උල් හක්ට එම ටෙස්ට් තරගයේ දෙවන ඉනිමේදී මියන්ඩාඩ් අභිබවා යන්නට ලබාගත යුතුව තිබුණේ ලකුණු 6කි.

ක්‍රිඩා පිටියට පැමිණ මුහුණ දුන් පළමු පන්දුවේදීම එම ලකුණු පරතරය ලකුණු 3 දක්වා අඩු කරගත් ඔහු එම පන්දුවාරය අවසන් වනතුරු පන්දු යවන්නාගේ අන්තයේ රැඳී සිටියේය.

තමන්ට අවශ්‍ය වටිනාම ලකුණු 3 ලබා ගැනීම සඳහා ඉන්සමාම් උල් හක්ට මුහුණදීමට සිදුව තිබුණේ දඟ පන්දු යවන්නෙකු වූ පෝල් හැරිස්ටය.

දඟ පන්දු යවන්නන්ට මුහුණදීමේදී වැඩි කුසලතාවක් දක්වන ඉන්සමාම් උල් හක්ට එය මහත් අස්වැසිල්ලක් වූවාට සැක නැත. විශේෂයෙන්ම පෝල් හැරිස් සුපිරි දඟ පන්දු යවන්නෙකු ලෙස පිළිගැනීමක් නැති ක්‍රීඩකයෙකුවීමද ඉන්සමාම්ට සතුටු විය හැකි කරුණක් වී තිබුණා විය හැකිය.

කොහොම නමුත් කාටත් මතක හිටින පහරක් එල්ල කරමින් මියන්ඩාඩ්ගේ වාර්තාව ඩැහැ ගැනීම වඩාත් සුදුසු යැයි උල්හක්ට හිතෙන්නට




ඇත. කාටත් මතක හිටින පහරක් නම් එය හයේ පහරක්ම විය යුතු යයි තීරණය කළ උල්හක් පෝල් හැරිස් ගුවනේ පා කර එවූ පන්දුවකට සීමාවෙන් ඉදිරියට ගොස් දැවැන්ත පහරක් එල්ල කළේය.

අවාසනාවකට සුළඟ දෙබෑ කරමින් ඉන්සමාම් උල් හක්ගේ දෑතේ රැඳුන පිත්ත වේගයෙන් චලනය වූවද ඉන්සමාම් මෙන්ම ඔහු අත රැඳුණු පිත්තද මුලා කරන්නට සමත් වූ පෝල් හැරිස් එවූ පන්දුව කඩුල්ල පිටුපස සිටි මාක් බවුචර් නැමැති දඬයක්කරුවාගේ අත් ආවරණය තුළ සැඟවුණි.

කළයුතු ඉතිරි කොටස මොහොතක හෝ ප්‍රමාදයක් නැතුව ඉටු කරන්නට බවුචර් සමත් විය. ඉන්සමාම් උල් හක්ගේ දෝතටම ආ අගනා වාර්තාව අතහැර දමා ඔහු ඊට පා පහරක්ද එල්ල කළා වැනි තත්ත්වයක් මෙම දැවීයාමේ සටහන්ව තිබුණි. පෝල් හැරිස් එවන ලද එම පන්දුවට සමාන පන්දුවලට තමන් මීට පෙර ඕනෑතරම් හයේ පහර එල්ල කර ඇති බව තරගයෙන් පසු ප්‍රකාශ කළ උල්හක් එහෙත් මෙවර පන්දු යවන්නාට ජයග්‍රහණය අයිති වූ බව පිළිගත්තේය.

කොහොම නමුත් වසර 16 කට ආසන්න කාලයක් ක්‍රිකට් පිටිය ඒකාලෝක කළ සුපිරි ක්‍රීඩකයෙකුට ක්‍රීඩාපිටිය හැරයාම වේදනාවක් නොවේ නම් එය පුදුමයකි. ඒ නිසා ඔහුගේ සමුගැනීම පාකිස්ථානුවන් මෙන්ම ඔහුද සිහිපත් කරන්නට ඇත්තේ අතීතය වෙත මතකයේ එළි දල්වමිනි.

එහිදී අතීතය, වර්තමානය හා අනාගතය යන කාල පරාසයන් සංසන්දනය කිරීමට උත්සාහ කිරීම කාගේත් සාමාන්‍ය සිරිතය. වේදනාව උපදින්නේ එතැනදීය.

එහෙත් ඉන්සමාම්ගේ සමුගැනීම ඊට ද බොහෝ සේ වෙනස්ය. සමුගන්නා අවසන් ඉනිමේදී අතීතය අලුත් කරන්නට තිබූ කදිම අවස්ථාව මඟ හැරී යාම කිසි දිනක මැකී නොයන වේදනාවක් ඉන්සමාම් උල් හක් ට ඉතිරි කර අවසන්ය.